කොළඹ විශ්වවිද්‍යාලය
සිංහල අධ්‍යයනාංශය
ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - 2019

# SLG 2216 - නූතන සිංහල භාෂා ව්‍යවහාරය

(පැ දෙකයි)

ප්‍රශ්න හතරකට (4) පමණක් පිළිතුරු සපයන්න.

---

1. 'ව්‍යාකරණය' හා 'ව්‍යවහාරය' අතර ඇති සම්බන්ධය සිංහල භාෂාව ඇසුරින් විවරණය කරන්න.

2. "සිංහල හෝඩියේ අක්ෂර සංඛ්‍යාව කාලයත් සමග වෙනස් වී ඇත." පැහැදිලි කරන්න.

3. සිංහල අක්ෂර වින්‍යාසයෙහි දැකිය හැකි 'විකල්ප ප්‍රයෝග' හා ' සාවද්‍ය ප්‍රයෝග' අතර ඇති වෙනස්කම් නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

4. "පද සාධනයෙහි ලා යොදා ගනු ලබන කුඩාතම භාෂාංගය 'පදාණුව' නම් වේ." නිදසුන් ඇසුරින් විමසන්න.

5. " නූතන සිංහල ලේඛන ව්‍යවහාරයේ බහුලව දැකිය හැක්කේ මිශ්‍ර සිංහල සන්ධි ය." නිදසුන් මගින් පැහැදිලි කරන්න.

6. සිංහල භාෂා ව්‍යවහාරයේ දැකිය හැකි <u>තත්සම</u>, <u>තද්භව</u> හා <u>නිෂ්පන්න</u> යන පද වර්ග පිළිබඳ විමසීමක් කරන්න.

7. පහත සඳහන් මාතෘකාවලින් <u>තුනක්</u> (3) පිළිබඳව සටහන් ලියන්න.

   (අ ) සිදත් සඟරා හෝඩිය

   (ආ) සම්භාව්‍ය රීතිය

   (ඇ) නිවැරදි වහර

   (ඇ) උක්ත - අනුක්ත භේදය